**ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව - 2022**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු ඇස්තමේන්තු කර ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී එය වියදම් ණයහිමි ගිණුමට ගැළපීම් කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළිය රු.7,245 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු සහ 2020, 2021 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.331,500 ක මුද්දර ගාස්තු ද ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ අවසන් ගිණුම් සකස් කිරීමේදී එය සමුච්චිත අරමුදලට ගැළපීම් කර මෙම අඩුපාඩුව නිවැරදි කරන බව. | -එම- |
| (ඈ) | පරිත්‍යාග ලෙස ලැබුණු එකතුව රු.408,244 ක් වූ භාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ අවසන් ගිණුම් සකස් කිරීමේදී ඒවා ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරන බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.128,966,966 ක් වටිනා ගිණුම් ශේෂ 06 ක්, අයිතිය තහවුරු කරන ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, ඉන්වෙන්ට්‍රි, භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ ගබඩා ලේඛන | ලේඛන යාවත්කාලීන කිරීම කඩිනමින් කරන බව. | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 24 වගන්තිය | සභාව විසින් ඉදිකර ඇති මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර එම මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | බල ප්‍රදේශය තුළ පවතින සියළුම මාර්ග පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, ඉදිරියේදී එම මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමටද අවශ්‍ය පියවර ගනන්නා බව. | පවත්නා සියලු මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට අදාළ කාර්ය සාධන වාර්තාව ද සමඟින් අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 193 වැනි රීතිය | අයවැයගත මුල්‍ය ප්‍රකාශන පරිපූර්ණ සම්මත සමඟ සසඳා බලන කල එක් එක් ආදායම් විෂයයන් සහ වියදම් විෂයයන් යටතේ ඇති වූ ඌණතාවයන්/අතිරික්තතාව යන් පිළිබඳ ප්‍රකාශයන් කරුණු පැහැදිලි කිරීම්ද සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | අදායම් සහ වියදම්වල අයවැයගත වටිනාකමත් සත්‍ය වටිනාකමත් සන්සන්දනය කරමින් ප්‍රකාශනයක් පිළියෙළ කරන ලෙසට අදාළ නිලධාරීන්ට මේ වන විට උපදෙස් ලබා දී ඇති අතර, ප්‍රවර්තන වසරේ සිට එම වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 218 වැනි රීතිය | පිරිවැය රු.71,084,473ක ඉඩම් හා ගොඩනැගිලි | ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | | සමීක්ෂණය කර නොතිබුණි. | කිරීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව. | යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1654 (ආ) 1646 | සභාවේ වාහන 08 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අළුතින් පත්වීම් ලද සංවර්ධන නිලධාරීවරයකු වෙත වාහන විෂය මාරු කිරීම හේතුවෙන් මෙම අතපසු වීම සිදුව ඇති අතර එය නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 225,135 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,951,382 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ව්‍යාපාර බදු | 454 | 74 | 164 | - | 404 | 98 | 98 | 90 |
| කුලී | 4,133 | 627 | 475 | 325 | 4,418 | 2,858 | 2,685 | 173 |
| බලපත්‍ර ගාස්තු | 253 | 33 | 33 | - | 187 | 18 | 18 | - |
| වෙනත් ආදායම් | 638 | 1,324 | 2,252 | 150 | 3,157 | 3,335 | 2,901 | 1,078 |
| එකතුව | 5,478 | 2,058 | 2,924 | 475 | 8,166 | 6,309 | 5,702 | 1,341 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කුලී** | | |

| | | |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු.325,572 ක හිඟ කුලී ආදායමක් පැවැති අතර එයින් රු.173,392 ක් වූ කුලී ආදායම් වසර ගණනාවක සිට හිඟව පැවතුණි. | හිඟ ආදායම් අය කර ගැනීම සඳහා මේ වන විට කඩිනම් ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කාර්‍යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 න් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ අතර පළාත් සභාව විසින් හඳුන්වාදුන් අතුරු ව්‍යවස්ථා 05 ක් වැළඳගෙන තිබුණි. | බල ප්‍රදේශයට ගැළපෙන අතුරු ව්‍යවස්ථා පනවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි මේ වන විට අවධානය යොමු කර ඇත. තවද, ප්‍රදේශයේ පවතින දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණය කොට සභාවට අයවිය යුතු ආදායම් අය කර ගැනීමට නව ආදායම් පරීක්ෂකවරයා මගින් මේ වන විට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා සත්‍ය වශයෙන්ම සිටින සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 07 ක පුරප්පාඩු 10 ක් පැවතුණි. | මෙම සේවක පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ බලධාරීන් වෙත වරින් වර ඉල්ලීම් සිදු කළ ද මේ වන තෙක් ඊට සාධාරණ විසඳුමක් ලැබී නොමැති අතර ස්ථිර ආදායම් පරීක්ෂකවරයකු මේ වන විට අප සභාවට අනුයුක්ත කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ PT/03/2021 ට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 09 දෙනෙකුගෙන් රු.60,000 ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2007 වර්ෂයේදී මිය ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.147,600 ක ණය ශේෂයන් අයකර ගත නොහැකිව පවතී. | මිය ගිය නිලධාරියාගේ විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ ඉදිරි කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින බැවින් ඔහුට පාරිතෝෂිත මුදල් ගෙවනු ලබන | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අවස්ථාවේදී ණය ශේෂය අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අංක 168 අනුව ඉකුත් වර්ෂය සඳහා වූ ගිණුම් සාරාංශයේ විස්තර හා ගෙවීම් වවුචර් හා වර්ගීකරණ ප්‍රකාශද සමඟ එක් එක් වර්ෂයේ ගිණුම් ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම බලධාරියා විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ගිණුම් 2023 අප්‍රේල් 10 වන දින ඉදිරිපත් කර තිබුණි. | අවසන් ගිණුම් ප්‍රකාශන සකස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහිත විෂය නිලධරයන් නොමැති කමින් මෙම ප්‍රමාදය සිදුව ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් නියමිත දිනය ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 05 ක සියයට 52.64 සිට සියයට 107.79 දක්වාද වියදම් විෂයයන් 06 ක සියයට 16.35 සිට සියයට 100 ක් දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයන් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | අඩු ආදායම්ලාභී සභාවක් බැවින් අයවැය මගින් සැලසුම් කළ පරිදි ආදායාම් නොලැබීම හේතුවෙන් වියදම් කළමනාකරණය කර ගැනීමට සිදු වීම නිසා වැය විෂය ප්‍රතිපාදන ඉතිරි වීමට එකී කරුණ බලපා ඇති අතර, ඉදිරියේදී නිසි කළමනාකරණයකින් හා පාලනයකින් යුතුව අයවැය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

### 4.3 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ ඇතුළත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක | ප්‍රාදේශිය සභා මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි තිරසාර සංවර්ධන ඉලක්ක | 2030 වන විට අත්පත් කළ යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම හා |

| | | |
|---|---|---|
| හා අදාළ නිර්ණායක හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන එම ඉලක්ක ගත අරමුණු ඉටුකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අත්පත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |